**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති පරිගණක වැඩසටහන්කරු තනතුරු සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් ද්විතීයන පදනම මත බඳවා ගැනීම.**

01. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති පරිගණක ක්‍රමලේඛක තනතුරු සඳහා රජයේ අවශ්‍යතාවය මත ද්විතීයික පදනම මත බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවයේ දැනට සේවය කරන මේ සඳහා උනන්දුවක් දක්වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ට සිය අයදුම්පත්, ජීව දත්ත පත්‍රිකාව (CV), රාජ්‍ය සේවයේ සේවය තහවුරු කිරීමේ ලිපිය, අදාළ වෘත්තීය සුදුසුකම් ලේඛනවල සහතික කළ පිටපත් සහ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කරන ලෙස ආරාධනා කෙරේ. අයදුම්පත් 2025.03.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

03. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

i. ජීව දත්ත පත්‍රිකාවෙහි නම, ජාතික හැඳුනුම්පත් අංකය, සක්‍රිය දුරකථන අංකයක් පැහැදිලිව සඳහන් කළ යුතුය

ii. මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II/I ශ්‍රේණියේ MN 6 – 2016 යටතේ වැටුප් ලබන නිලධාරීන්ට පමණි.

iii. ජාල පරිපාලනය, දෘඩාංග දෝෂ නිරාකරණය, මෘදුකාංග/වෙබ් අඩවි සංවර්ධනය පිළිබඳ විශේෂඥතාවක් ඇති අපේක්ෂකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලබන අතර ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ද සලකා බලනු ලැබේ..

iv. PDF ආකෘතියෙන් සකස් කරන ලද අයදුම්පත careers@trc.gov.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. ඔබ අයදුම් කරන තනතුර ඔබේ විද්‍යුත් තැපෑලෙහි විෂයය යටතේ සඳහන් කළ යුතුය.

v. වැඩිදුර විමසීම් 0112-2689345 දුරකථන අංකය ඔස්සේ සිදු කළ හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව